සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**පළමු වාර පරීක්ෂණය 2015**

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I

**10 ශ්‍රේණිය** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01 පහත සඳහන් දෑ අතුරින් මිනිස් අවශ්‍යතාවක් වනුයේ,
(1) බෙහෙත් (2) පොත්පත් (3) ඇඳුම් (4) පාවහන්

02 මිනිස් අවශ්‍යතා සපුරාගන්නා විවිධ ආකාර වුවමනා ලෙස හැඳින්වේ. ඒ අනුව වුවමනාවල ලක්ෂණයක් විය නොහැක්කේ,
(1) අත්‍යාවශ්‍ය නොවීම. (2) විවිධ වීම.
(3) නිර්මාණය කළ හැකි වීම. (4) සංකීර්ණ නොවීම.

03 අවශ්‍යතා හා වුවමනා සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,
(1) වුවමනා තුළින් අවශ්‍යතා ගොඩනැගීමයි.
(2) වුවමනා අසීමිත වන අතර අවශ්‍යතා සීමිත වීමයි.
(3) අවශ්‍යතා තුළින් වුවමනා ගොඩනැගීමයි.
(4) අවශ්‍යතා පොදු වන අතර වුවමනා පෞද්ගලික වීමයි.

04 ව්‍යාපාරික ආයතනයකට පොදුවේ දැකිය හැකි අරමුණු අතර උප අරමුණක් වනුයේ,
(1) ලාභ ඉපයීමයි.
(2) පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීමයි.
(3) රැකියා වියුක්තියයි.
(4) භාණ්ඩ හා සේවාවල ගුණත්වය ඉහළ නැංවීමයි.

05 භාණ්ඩ හා සේවාවල දැකිය හැකි පොදු ලක්ෂණයක් වන්නේ,
(1) මිලක් ගෙවා ලබාගත යුතු වීමයි.
(2) අවශ්‍යතා ඉටුකර ගැනීමට යොදාගැනීමයි.
(3) ගබඩාකර තබාගත හැකිවීමයි.
(4) සපයන්නාගෙන් වෙන්කළ හැකිවීමයි.

06 ව්‍යාපාරික ආයතනයක් වශයෙන් හැඳින්වෙන්නේ,
(1) ලාභ ලැබීමේ අරමුණින් කරනු ලබන ඕනෑම කටයුත්තකි.
(2) භාණ්ඩ නිෂ්පාදනය හා බෙදාහැරීමයි.
(3) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලන ඕනෑම කටයුත්තකි.
(4) පුද්ගලයින් කිහිප දෙනෙකුගේ ක්‍රියා කලාපයන් සමූහයකි.

07 භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය වන සම්පත් නිෂ්පාදන සාධක ලෙස හඳුන්වයි. මෙම නිෂ්පාදන සාධක මූලික ලෙස භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය හා ව්‍යවසාය ලෙස වර්ග කරන අතර එම සාධක සඳහා ලැබෙන ලැබීම් පිළිවෙලින් දැක්වෙනුයේ,
(1) බදු කුලී, වැටුප්, ලාභ, පොලී (2) බදු කුලී, වැටුප්, පොලී, ලාභ
(3) පොලී, ලාභ, බදු කුලී, වැටුප් (4) පොලී, වැටුප්, බදු කුලී, ලාභ

08 ව්‍යාපාරය කෙරෙහි ඇල්මැති පාර්ශවයන් ව්‍යාපාරය තුළින් විවිධ අරමුණු ඉටුකර ගැනීමට අපේක්ෂා කරයි. ඒ අනුව කළමනාකරණ පාර්ශවය අපේක්ෂා කරන අරමුණක් විය නොහැක්කේ,
(1) කළමනාකරණ තීරණ ගැනීම
(2) රැකියා වියුක්තියේ වර්ධනය
(3) රැකියා තෘප්තිය
(4) ව්‍යාපාරයට ගත් කළමනාකරණ තීරණ සාර්ථකත්වය

09 ඇල්මැති පාර්ශවවල විවිධ අරමුණු ඉටුවන පරිදි ව්‍යාපාර කටයුතු කළ යුතුය. එම පාර්ශව මගින් ව්‍යාපාරය අපේක්ෂිත දායකත්වයන් අතර ව්‍යාපාර සඳහා හිතකර විවිධ දිරිගැන්වීම් ලබාදීම අපේක්ෂා කරන්නේ,
(1) කළමනාකරුගෙන් (2) සේවකයාගෙන් (3) සැපයුම්කරුවන්ගෙන් (4) රජයෙන්

10 ව්‍යාපාර පරිසරය වර්ග කිරීමේ දී එකම පරිසරයට අයත් සාධක පමණක් ඇතුළත් වන්නේ,

(1) ගනුදෙනුකරුවෝ, සැපයුම්කරුවෝ, සේවකයෝ, තරගකරුවෝ

(2) ගනුදෙනුකරුවෝ, කළමනාකරුවෝ, සේවකයෝ, තරගකරුවෝ

(3) ගනුදෙනුකරුවෝ, සැපයුම්කරුවෝ, තරගකරුවෝ, ආර්ථික පරිසරය

(4) ගනුදෙනුකරුවෝ, සේවකයෝ, සැපයුම්කරුවෝ, ආර්ථික පරිසරය

11 බැංකු තැන්පතු සඳහා ලබාදෙන පොලී අනුපාතයන් ඉතා අඩු මට්ටමක පවතින බැවින් පුද්ගලයන් තම ආයෝජන මුදල් බැංකු තැන්පතුවල නොයොදා වෙනත් විකල්ප මාර්ගවල යෙදීමට පෙළඹී ඇත. මෙම තත්ත්වයට තුඩුදෙන පරිසර සාධකය කුමක් ද?

(1) ආර්ථික පරිසරය (2) දේශපාලන පරිසරය

(3) නෛතික පරිසරය (4) තාක්ෂණික පරිසරය

12 අතුරු අයවැය යෝජනා මගින් ව්‍යාපාර සඳහා බදු සහන ලබාදීම සිදුවී ඇත. බාහිර පරිසරය අධ්‍යයනය මගින් ඉහත තත්ත්වය මත ව්‍යාපාරයකට අත්කර ගත හැකි වන්නේ,

(1) ශක්තියකි. (2) අවස්ථාවකි. (3) දුර්වලතාවයකි. (4) තර්ජනයකි.

13 ව්‍යාපාරයකට බලපෑ හැකි තර්ජනයක් වනුයේ,

(1) අධික වර්ෂාව මත බදුල්ල, බණ්ඩාරවෙල වැනි ප්‍රදේශවලට අධික ලෙස හානි සිදුවීම.

(2) සේවකයන්ගේ අයහපත් ආකල්ප

(3) පිළිගත් සංගම් නාමයක් තිබීම.

(4) අධිවේගී මාර්ග ඉදිකිරීම.

14 හිමිකාරත්වය මත ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී පෞද්ගලික අංශයට අයත්වන ව්‍යාපාර සංවිධානයක් නොවන්නේ,

(1) සංස්ථාපිත සමාගම් (2) සමුපකාර සමිති (3) රාජ්‍ය සමාගම් (4) දෙපාර්තමේන්තු

15 අරමුණු අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී ලාභ අරමුණු කර නොගත් පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානයක් වනුයේ,

(1) රාජ්‍ය සංස්ථා (2) සමුපකාර සමිති

(3) දෙපාර්තමේන්තු (4) රාජ්‍ය සමාගම්

16 ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හඳුන්වා දෙන පරිදි සේවක සමාගම් සංඛ්‍යාව කුමන ප්‍රමාණයට අඩු ව්‍යාපාර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වේ ද?

(1) සේවක සංඛ්‍යාව 25 ට අඩු ව්‍යාපාර (2) සේවක සංඛ්‍යාව 25 ට වැඩි ව්‍යාපාර

(3) සේවක සංඛ්‍යාව 100 ට අඩු ව්‍යාපාර (4) සේවක සංඛ්‍යාව 100 ට වැඩි ව්‍යාපාර

- විකුම්සිරි මහතා ''රස බොජුන්'' නමින් ආපනශාලාවක් පවත්වාගෙන යයි. සුළුවෙන් ආරම්භ කළ මෙම ව්‍යාපාරය අයිතිකරුගේ කැපවීම හා දක්ෂතාවය මත වර්තමානයේ බේකරියක් ද සමගින් මහා පරිමාන ව්‍යාපාරයක් බවට පත්ව ඇත.

17 ඉහත විකුම්සිරි මහතාගේ ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධානයකට අයත්වේ ද?

(1) හවුල් ව්‍යාපාර (2) කේවල ස්වාමි ව්‍යාපාර

(3) සී/ස පෞද්ගලික සමාගම් (4) සමිති සංවිධාන

18 මෙවැනි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමට අදාළ වන පනතක් පවතීද? එසේ නම් එම පනත වනුයේ,

(1) 2007 අංක 7 දරණ සමාගම් පනත

(2) 1972 අංක 5 දරණ පනත

(3) 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ආඥා පනත

(4) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත

19 ව්‍යාපාර සංවිධාන අතරින් තීරණ ගැනීමේ දී වඩාත් ස්වාධීන ව්‍යාපාර සංවිධාන වර්ගය වනුයේ,

(1) හවුල් ව්‍යාපාර (2) සී/ස සමාගම්
(3) සමිති සංවිධාන (4) ඒක පුද්ගල ව්‍යාපාර

20 නීතිමය පුද්ගලභාවයක් නොමැති ව්‍යාපාර සංවිධානයක් වන්නේ,
(1) සීමිත පෞද්ගලික සමාගම් (2) හවුල් ව්‍යාපාර
(3) සීමිත පොදු සමාගම් (4) රාජ්‍ය සංස්ථා

21 හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් අදාළ නොවන ලක්ෂණයක් වන්නේ,
(1) සාමාජිකයන් අවමය 2 ක් ද, උපරිමය 20 කට ද සීමාවේ.
(2) ලියාපදිංචිය අනිවාර්ය නොවීම.
(3) අඛණ්ඩ පැවැත්මක් තිබීම.
(4) වැඩි ප්‍රාග්ධනයක් රැස්කළ හැකි වීම.

22 කේවල ස්වාමි ව්‍යාපාර හා හවුල් ව්‍යාපාරවල දැකිය නොහැකි එහෙත් සීමිත සමාගම්වල දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,
(1) අරමුණක් තිබීම. (2) වගකීම සීමාසහිත වීම.
(3) පැවැත්මක් තිබීම. (4) ආර්ථික කටයුත්තක නියැලීම.

23 ''හවුල් ගිවිසුම'' යන පදයෙන් අදහස් වන දෑ දැක්වෙන පිළිතුර වන්නේ,
(1) හවුල් ව්‍යාපාරයක් ආරම්භයේ හවුල්කරුවන් අතර ඇතිවන ලිඛිත, වාචික හෝ ව්‍යංගයෙන් ඇතිකර ගන්නා එකඟතාවයි.
(2) හවුල් ව්‍යාපාරයක් ආරම්භයේ හවුල් ව්‍යාපාරය ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කළයුතු ගිවිසුමයි.
(3) හවුල් ව්‍යාපාරයක් ආරම්භයේ අවම හවුල්කරුවන් සිටින බව දන්වා එවන ලියවිල්ලයි.
(4) හවුල් ව්‍යාපාරයක් අවසන් කරන විට ඒ බව සඳහන් කරන ගිවිසුමයි.

24 සීමාසහිත සමාගමකින් සිදුවූ අසාධාරණයකට විරුද්ධව නඩු පැවරීමට ගිය පාරිභෝගිකයකුට ලැබුනු උපදේශය වූයේ එම සමාගමේ නමින්ම නඩු පැවරිය යුතු බවයි. මෙයට හේතුව වන්නේ,
(1) සමාගම ලියාපදිංචි කර ඇති නිසාය.
(2) සමාගමේ නමින් හඳුනන නිසාය.
(3) සමාගමට නීතිමය පුද්ගලභාවයක් තිබෙන නිසාය.
(4) වැයවන වියදම අඩු නිසාය.

25 ව්‍යාපාර සංවිධාන ගැන සැලකීමේ දී ලාභය අයිතිකරුවනට පෞද්ගලිකව හිමි නොවන ව්‍යාපාර සංවිධානය වනුයේ,
(1) සීමා සහිත සමාගම් (2) හවුල් ව්‍යාපාරය
(3) කේවල ස්වාමි ව්‍යාපාරය (4) සමිති සංවිධානය

26 ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පවතින ව්‍යාපාර සංවිධානය වනුයේ,
(1) සීමා සහිත පොදු සමාගම් (2) රාජ්‍ය සංස්ථා
(3) සමුපකාර සමිති සංවිධාන (4) දෙපාර්තමේන්තු

27 ව්‍යාපාර සංවිධානවල පාලනය ගැන කථා කිරීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් පාලනය නොවන ව්‍යාපාර සංවිධානයක් ලෙස හැඳින්විය හැක්කේ,
(1) සමුපකාර සමිති (2) රාජ්‍ය දෙපාර්තමේන්තු
(3) රාජ්‍ය සංස්ථා (4) සීමාසහිත සමාගම්

28 ව්‍යාපාර ඒකකයක් පිළියෙල කර නිකුත් කරන මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමේ ප්‍රධාන පරමාර්ථය වන්නේ,
(1) ඇල්මැති පාර්ශවයන් වෙත තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සැපයීමට
(2) ව්‍යාපාරය ප්‍රමාණවත් ලාභයක් උපයා තිබේද යන්න දැනගැනීමට
(3) ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය සතුටුදායකද යන්න දැනගැනීමට
(4) නීතිමය අවශ්‍යතා ඉටුකරවා ගැනීමට

29 ගිණුම්කරණයේ දී සැලකිල්ලට නොගන්නා ගනුදෙනුවක් විය හැක්කේ,
(1) රු. 60000/ වටිනා බඩු තොගයක් ගැනීම.
(2) රු. 100000/ බැංකු ණයක් ලබාගැනීම.

(3) සේවකයින් 8 දෙනෙකු බඳවාගැනීමට තීරණය කිරීම.

(4) රු. 2000/ වරිපනම් බිල ගෙවීම.

30 ව්‍යාපාර සඳහා ගිණුම්කරණ ක්‍රියාවලියක් අවශ්‍ය වන්නේ,

(1) ව්‍යාපාර බහුලවීම නිසාය. (2) ආර්ථික සම්පත් සීමිතවීම නිසාය.

(3) අවශ්‍යතා හා වුවමනා සංකීර්ණ නිසාය. (4) නීතියෙන් එය අනිවාර්ය නිසාය.

31 පුද්ගලයෙක් ව්‍යාපාරයක වත්කම් සම්බන්ධ පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කරයි.

A අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇතිවීම.

B ව්‍යාපාරයේ පාලනයට යටත්වීම.

C අනාගතයේ දී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාබ ගලාඒම.

D ව්‍යාපාරයේ පාලනයට යටත් නොවීම.

ඒ අනුව වත්කමක ලක්ෂණ ලෙස දැක්විය හැක්කේ,

(1) A B C D යන සියල්ල (2) A B පමණි. (3) A B C පමණි. (4) A C පමණි.

32 ව්‍යාපාරයක ජංගම නොවන වත්කම්වලට අයත් නොවන වත්කමක් වනුයේ,

(1) ගොඩනැගිලි (2) බඩු තොගය (3) උපකරණ (4) රථවාහන

33 වත්කමක් ජංගම වත්කමක් ලෙස සැලකීමට පදනම් කරගන්නා පදනම වනුයේ,

(1) අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇතිවීමයි.

(2) ව්‍යාපාරයේ පාලනයට යටත් නොවීමයි.

(3) අනාගතයේ දී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලාඒමයි

(4) ව්‍යාපාර කටයුතුවල දී මාස 12 වැනි කෙටි කාලයක් තුළ පාවිච්චි කිරීමට අපේක්ෂා කිරීමයි.

- ව්‍යාපාරයක් වගකීම් සම්බන්ධ පහත සඳහන් තොරතුරු සපයයි.

බැංකු ණය රු. 200000 ණය හිමියෝ රු. 30000

ගෙවිය යුතු විදුලි වියදම රු. 5000 උගස් ණය රු. 60000

34 ව්‍යාපාරයේ ජංගම නොවන වගකීම්වල වටිනාකම වනුයේ,

(1) රු. 260000 (2) රු. 230000 (3) රු. 290000 (4) රු. 235000

35 ව්‍යාපාරයේ ජංගම වගකීම්වල වටිනාකම වනුයේ,

(1) රු. 30000 (2) රු. 35000 (3) රු. 95000 (4) රු. 230000

36 ව්‍යාපාරයක මුළු වත්කම් රු. 450000 ද, බැංකු ණය රු. 100000 ද, ණය හිමියෝ රු. 20000 ද පවතී යැයි සිතමු. එම ව්‍යාපාරයේ අයිතිකරුගේ හිමිකම වනුයේ,

(1) රු. 450000 (2) රු. 550000 (3) රු. 330000 (4) රු. 350000

- චාමින්ද ව්‍යාපාරයට ප්‍රාග්ධනය වශයෙන් රු. 200000 යොදා ඇත. කිසියම් මාසයක් තුළ විකුණුම් ආදායම රු. 75000 කි. රු. 20000 වැටුප් ගෙවා ඇති අතර, රු. 8000 ක කොමිස් ලැබී ඇත. එම කාලය තුළම ණය පොලී වශයෙන් රු. 2000 ගෙවා ඇති අතර රු. 50000 අතිරේක ප්‍රාග්ධනයක් යොදවා ඇත.

37 චාමින්දගේ ව්‍යාපාරය ඉහත මාසය තුළ ලැබූ මුළු ආදායම කොපමණ ද?

(1) රු. 95000 (2) රු. 22000 (3) රු. 83000 (4) රු. 45000

38 චාමින්දගේ ව්‍යාපාරය ඉහත මාසය තුළ දැරූ මුළු වියදම කොපමණ ද?

(1) රු. 72000 (2) රු. 22000 (3) රු. 30000 (4) රු. 95000

39 චාමින්දගේ ව්‍යාපාරය ඉහත මාසය තුළ ලැබූ ආදායම කොපමණ ද?

(1) රු. 50000 (2) රු. 55000 (3) රු. 61000 (4) රු. 53000

40 මාසය අවසානයේ චාමින්දගේ හිමිකම වැඩිවීමට බලපානු ලබන්නේ,

(1) දරන ලද මුළු වියදම පමණි.

සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## පළමු වාර පරීක්ෂණය 2015

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II

**10 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01 හේන් ගොවිතැන හා කුඹුරු ගොවිතැන තම ජීවිකාව කරගත් පවුලක උපන් ශාමින්ද උත්සාහවන්ත තරුණයෙකි. ඔහු දිනක් මිලදී ගත් ලොතරැයි පතකට රු. 100000/ දිනුමක් විය. ඔහු මෙම මුදල යොදවා තම නිවස ඉදිරිපිට එළවළු අලෙවි කිරීමේ වෙළඳ සැලක් ආරම්භ කර පවත්වාගෙන යයි.

(1) ශාමින්ද විසින් පවත්වාගෙන යන ව්‍යාපාරය කුමන වර්ගයේ ව්‍යාපාර සංවිධානයකට අයත්වේ ද?

(2) මෙම ව්‍යාපාරය මගින් ඉටුකරන මිනිස් අවශ්‍යතාව සඳහන් කරන්න.

(3) මෙම ව්‍යාපාර සංවිධානය සම්බන්ධ පවතින වාසි දෙකක් ලියන්න.

(4) මෙම ව්‍යාපාර සංවිධානය සම්බන්ධව පැවතිය හැකි අවාසි දෙකක් ලියන්න.

(5) ව්‍යාපාර සම්බන්ධයෙන් පොදුවේ පැවතිය හැකි ව්‍යාපාර අරමුණු දෙකක් ලියන්න.

(6) එම අරමුණු ඉටුකර ගැනීමේ දී පැවතිය හැකි උප අරමුණු දෙකක් ලියන්න.

(7) මෙම ව්‍යාපාරය සම්බන්ධයෙන් පැවතිය හැකි ශක්තීන් දෙකක් ලියන්න.

(8) පැවතිය හැකි දුර්වලතා දෙකක් ලියන්න.

(9) මෙම ව්‍යාපාරයට මුහුණදීමට සිදුවියහැකි අවස්ථා දෙකක් ලියන්න.

(10) මුහුණදීමට සිදුවියහැකි තර්ජන දෙකක් ලියන්න. (2 x 10 = 20)

02 (1) මිනිස් අවශ්‍යතා 4 ක් සඳහන් කරන්න.

(2) එම අවශ්‍යතා සපුරාගන්නා ආකාර සඳහන් කරන්න.

(3) මිනිස් අවශ්‍යතාවල දැකිය හැකි ලක්ෂණ 4 ක් ලියන්න.

(4) මිනිස් වුවමනාවල දැකිය හැකි ලක්ෂණ 4 ක් ලියන්න.

(5) භාණ්ඩ සම්බන්ධයෙන් පැවතිය හැකි ලක්ෂණ 2 ක් ද, සේවා සම්බන්ධයෙන් පැවතිය හැකි ලක්ෂණ 2 ක් ද සඳහන් කරන්න. (2 x 5 = 10)

03 (1) ව්‍යාපාරයක් යොදාගෙන ඇති කායික ශ්‍රමය හා මානසික ශ්‍රමය යන්න උදාහරණ පෙන්වමින් පැහැදිලි කරන්න.

(2) පහත වගුව පිටපත් කර ගනිමින් පිළිතුරු සපයන්න.

| අවශ්‍යතාව | අතීතයේ ඉටුකරගත් ආකාරය | වර්තමානයේ ඉටුකරගන්නා ආකාරය |
|---|---|---|
| 1. ආහාර | | |
| 2. ඇඳුම් | | |

(3) ව්‍යාපාරයක් කෙරෙහි තොරතුරු බලාපොරොත්තු වන ඇල්මැති අභ්‍යන්තර පරිසර සාධක 2 ක් ද, බාහිර පරිසර සාධක 2 ක් ද සඳහන් කරන්න.

(4) ඉහත (3) හි සඳහන් කළ පිළිතුරට අනුව ඇල්මැති අභ්‍යන්තර පරිසර සාධක 2 තොරතුරු බලාපොරොත්තුවීමේ අරමුණු 2 ක් ද බැගින් ලියන්න.

(5) ඉහත (3) හි පිළිතුරට අනුව ඇල්මැති බාහිර පරිසර සාධක 2 ව්‍යාපාරයට දායකත්වය

සපයන ආකාර 2 ක් බැගින් ලියන්න. (2 x 5 = 10)

04 (1) හිමිකාරත්වය මත ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී පෞද්ගලික අංශයට අයත් වන ව්‍යාපාර සංවිධාන හතරක් නම් කරන්න.

(2) තනි පුද්ගල ව්‍යාපාරයක් හා සැසඳීමේ දී හවුල් ව්‍යාපාරයක පැවතිය හැකි වාසිසහගත ලක්ෂණ 4 ක් සඳහන් කරන්න.

(3) සීමිත සමාගම් සම්බන්ධව දැකිය හැකි වාසිදායක ලක්ෂණ 4 ක් සඳහන් කරන්න.

(4) සමුපකාර සමිතියක් සම්බන්ධව දැකිය හැකි ලක්ෂණ 2 ක් සඳහන් කරන්න.

(5) ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් තනි පුද්ගල ව්‍යාපාරයකට ලබාගත හැකි ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (2 x 5 = 10)

05 (1) ව්‍යාපාරයක සිදුවේයැයි සිතිය හැකි ව්‍යාපාරික ගනුදෙනු 4 ක් සඳහන් කරන්න.

(2) ව්‍යාපාරයක් සතු වත්කම් හඳුන්වන්න. එහි ලක්ෂණ 2 ක් සඳහන් කරන්න.

(3) වගකීමක ලක්ෂණ නම් කරන්න. උදාහරණ දෙකක් ලියන්න.

(4) හිමිකම යන්න හඳුන්වන්න. හිමිකම වැඩිවීමට බලපාන ගනුදෙනුවක් ලියා දක්වන්න.

(5) ගිණුම්කරණයේ අරමුණු 2 ක් සඳහන් කරන්න. (2 x 5 = 10)

06 සෙව්වන්දි තමා ඉතිරි කරගත් රු. 125000 මුදලක් යොදවා ලිපි ද්‍රව්‍ය අළෙවි කිරීමට කුඩා ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ඇයගේ ව්‍යාපාරයේ පහත සඳහන් ගනුදෙනු සිදුවී ඇත. (සති දෙකක් තුළ)

විකිණීම සඳහා බඩු තොගයක් ගත්තා රු. 50000

වරිපනම් බිල ගෙව්වා රු. 500

රක්‍ෂණ ගාස්තු ගෙව්වා රු. 4000

බඩු තොගය විකුණා ආදායම් ලැබුනා රු. 75000

කඩ කාමර කුලී ගෙව්වා රු. 5000

කොමිස් ආදායමක් ලැබුනා රු. 3000

සෙව්වන්දි සතියක් අවසානයේ ප්‍රාග්ධනයට අමතර මුදල් දුන්නා රු. 10000

ඉහත තොරතුරු සැලකිල්ලට ගෙන ඔබ විසින්

(1) සෙව්වන්දිගේ ව්‍යාපාරයේ සති දෙක අවසානයේ මුළු ආදායම ගණනය කරන්න. (ල. 02)

(2) සති දෙක අවසානයේ මුළු වියදම ගණනය කරන්න. (ල. 02)

(3) සති දෙක අවසානයේ ලැබූ ලාභය, අලාභය ගණනය කරන්න. (ල. 02)

(4) ආරම්භක ප්‍රාග්ධනයට වඩා සති දෙක අවසානයේ ප්‍රාග්ධනය අඩුවී තිබේද? වැඩිවී තිබේද? හේතුව සඳහන් කරන්න. (ල. 04)

07 (1) ගිණුම්කරණයේ දී ගැනිලි වශයෙන් හැඳින්වෙන්නේ මොනවාදැයි පැහැදිලි කරන්න. (ල. 02)

(2) ජීවකගේ ව්‍යාපාරයේ පහත දක්වා ඇති අයිතම වත්කම් ද වගකීම් ද හිමිකම් ද ආදායම් සහ වියදම් ද යන්න අදාළ අනු අංකය සඳහන් කර ඉදිරියෙන් ලියා දක්වන්න.

උදා ගොඩනැගිලි වත්කම්

| | |
|---|---|
| 1. විකුණුම් | 2. විකුණූ භාණ්ඩ ගත් මිල (ගැණුම්) |
| 3. ණය ගැතියෝ | 4. ප්‍රාග්ධනය |
| 5. විදුලි ගාස්තු | 6. බැංකු ණය |

e-thaksalawa The National e-learning Portal for The General Education